**කොළඹ විශ්වවිද්‍යාලයීය කලා මණ්ඩලය මගින් සංවිධානය කරනු ලබන**
**සරසවි මියැසිය**
**විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථීන්ගේ ගී රසෝත්සය**

**අන්තර් පීඨ ගීත ගායනා තරගාවලිය සඳහා පොදු කොන්දේසි මාලාව**

1. කොළඹ විශ්වවිද්‍යාලයේ සියලුම පීඨවල අධ්‍යයන කටයුතුවල නිරත වන අභ්‍යන්තර විද්‍යාර්ථීන් සඳහා පමණක් සීමා වේ.
2. 2022 පෙබරවාරි 14 වන දින වන විටත් අධ්‍යයන කටයුතුවල නිරත වන විද්‍යාර්ථීන්ට මේ සඳහා ඉදිරිපත් විය හැකිය.
3. එක් පීඨයකින් විද්‍යාර්ථීන් 10 දෙනෙකු පමණක් තෝරාගනු ලැබේ.
4. අදාළ පීඨය නියෝජනය කරමින් තරගයට සහභාගි වන විද්‍යාර්ථීන් 10 දෙනාගේ නාම ලේඛනය තම පීඨයේ පීඨාධිපතිගේ නිර්දේශය සහිතව 2022-01-21 වන දිනට පෙර ශිෂ්‍ය අනුශාසක කාර්යාලය වෙත භාර දිය යුතුය.
5. ඔබ විසින් නම් කරනු ලබන නාම ලේඛනයේ ශිෂ්‍යාගේ/ශිෂ්‍යාවගේ සම්පූර්ණ නම, පීඨය, වසර, ශිෂ්‍ය හැඳුනුම්පත් අංකය හා දුරකථන අංකය සඳහන් කළ යුතුය.
6. කොළඹ විශ්වවිද්‍යාලයේ පීඨ 8 නියෝජනය කරමින් ඉදිරිපත් වන විද්‍යාර්ථීන් 80 දෙනා අතුරින් අවසන් පූර්ව වටය සඳහා එක් පීඨයකින් වැඩිම ලකුණු ලබා ගන්නා සිසුන් තිදෙනා බැගින් තේරී පත්වනු ඇත.
7. අවසන් පූර්ව වටයට තේරී පත්වන සිසුන් 24 දෙනා අවසන් මහා තරගය සඳහා තරග කිරීමට සුදුසුකම් ලබති.
8. අවසන් පූර්ව වටය සඳහා සුදුසුකම් ලබන විද්‍යාර්ථීන් 24 දෙනා වෙනුවෙන් එක් දින පුහුණු වැඩමුළුවක් ක්‍රියාත්මක වේ.
9. 2022-01-31 වන දින අවසන් පූර්ව වටය පැවැත්වීමට නියමිතය.
10. අවසන් මහා තරගය සඳහා සියලුම පීඨ නියෝජනය වන අතර එය 2022-02-14 වන දින දහවල් 2.30ට නව කලාගාරයේ පැවැත්වේ.
11. ඔබ පීඨයේ දමිළ භාෂාව කතා කරන සිසුන් සිටී නම් ඔවුන්ටද අවස්ථාව ලබා දීම අගය කොට සලකමි.
12. ඒකල ගායනා පමණක් ඉදිරිපත් කළ යුතුය.
13. සිංහල හෝ දෙමළ මාධ්‍ය අතුරින් එක් මාධ්‍යයක් තෝරා තරග කිරීමට අවස්ථාව උදා වේ.
14. එක් විද්‍යාර්ථියෙකු සඳහා එක් අවස්ථාවක් පමණක් හිමි වේ.
15. එක් ගීතයක් අවම වශයෙන් විනාඩි 2 තත්පර 30 සිට උපරිම විනාඩි 5ක් දක්වා විය යුතුය.
16. තරගයට උචිත පරිදි ඇඳුම් පැළඳුම් භාවිත කළ යුතුය.
17. තරග පැවැත්වෙන දින කිසිසේත් වෙනස් නොවේ.
18. අවසන් පූර්ව වටය සඳහා තේරී පත්වන සිසුන් 24 දෙනා සඳහා ඉදිරිපත් වීමේ සහතික පත්‍ර පිරිනැමේ.
19. අවසන් මහා තරගය ජයග්‍රහණය කරනු ලබන විද්‍යාර්ථීන් තිදෙනාහට සමරු තිළිණයක් සමග වටිනා සහතික පත්‍රයක් නිකුත් කරනු ලැබේ.
20. විශ්වවිද්‍යාලයේ නීතිරීතිවලට අනුකූලව විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වන අතර සියලුම ගායනයන් කොළඹ සරසවියේ ආචාර්ය මණ්ඩලයට හෝ විද්‍යාර්ථීන්ට පරිබාහිර විනිශ්චය මණ්ඩලයක් විසින් විනිශ්චය කරනු ලැබේ.
21. සමස්ත තරගාවලිය නිරෝධායන නීතිරීතිවලට අනුකූලව පැවැත්වේ.
22. මෙම තරගාවලිය විශ්වවිද්‍යාල සංස්කෘතික මධ්‍යස්ථානය හා ශිෂ්‍ය අනුශාසක කාර්යාලය සහයෝගයෙන් පවත්වනු ලැබේ.
23. වැඩි විස්තර සඳහා විමසන්න.

| | | | |
|---|---|---|---|
| කලා මණ්ඩලය සභාපති | 0714188710 | ශිෂ්‍ය අනුශාසක කාර්යාලය | 0715371523 |
| සංස්කෘතික මධ්‍යස්ථානය | 0718129130 | | |